# සාමාන්‍ය සමයේ විසිනවවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

රෝම 4 : 20 – 25

"දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගේ ඇදහිල්ල නිසා ඔහු ධර්මිෂ්ඨ බව පිළිගත් සේක."

ආබ්‍රහම් කිසි විටෙක දේව පොරොන්දුව කෙරෙහි සැක නොකොට ඇදහිල්ලෙහි බලවත්ව, දෙවියන් වහන්සේට ගෞරව කළේය. පොරොන්දු වූ දෙය ඉෂ්ට කිරීමට දෙවියන් වහන්සේ පොහොසත් බව ඔහු ඒකාන්තයෙන්ම විශ්වාස කළේය. එබැවින් "දෙවියන් වහන්සේ ඔහුගේ ඇදහිල්ල නිසා ඔහු ධර්මිෂ්ඨ බව පිළිගත් සේක" යන්න ලියන ලද්දේ ඔහු උදෙසා පමණක් නොව අප උදෙසාත් ය. අපගේ ස්වාමින් වන ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ තැනැන් වහන්සේ අදහන අපි ද එසේම පිළිගනු ලබමු. උන්වහන්සේ වනාහි අපේ පව් නිසා මරණයට පාවා දෙනු ලැබ, අප දෙවියන් වහන්සේ හා සමඟ දේව සබඳතාවට පමුණුවන පිණිස උත්ථාන කරනු ලැබූ සේක.

දේව වචනය මෙසේ ය.

# පිළිතුරු ගීය

ලූක් 1 : 69 – 75

පිළිතුර: අපට විමුක්ති උදා කළ සමිඳුන් හට තුති පැසසුම් වේවා!

ගීය:

"සිය දාසයා වූ දාවිත්ගේ වංශයෙන් අප හට බලවත් මිදුම්කාරයෙකු එතුමාණෝ එවූ සේක. එසේ වූයේ පෙර ශුද්ධ දිවැසිවරුන්ගේ මුවින් පැවසූ ලෙස ය.

රුපුන්ගෙන් හා අපට වෙර බැන්දවුන්ගෙන්, අප මුදාලන පිණිස එතුමාණෝ එය කළ සේක.
මෙසේ අප පියවරුන්ට කළ දයා පොරොන්දුව ඉටු කර, සිය ශුද්ධ ගිවිසුම සිහි කළ සේක.

එය, අප පිය ආබ්‍රහම්ට එතුමන් දිවුළ දිවුරුම ය. මෙසේ කළේ, අප සතුරන්ගෙන් මිදීම ලබමින් නොබියව එතුමන්ගේ සේවයේ යෙදෙමින් එතුමන් අබිමුවෙහි බැතියෙන් හා දැහැමින් දිවි ඇති තෙක් විසීමට ය."

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සම්බුදුනි, ඔබේ මාවත් අපට පැහැදිලි කළ මැනව.
ඔබේ සත්‍යය අනුව අප ගෙන ගිය මැනව.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය.
ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.
ආලේලූයා!

# සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 12: 13-21

"ඔබ රැස්කොට ගත් අගනා වස්තු සම්භාරයෙන් කුමන ඵලක් ද?"

සමූහයා අතරෙන් එක් තැනැත්තෙක් කතා කොට "ගුරු දේවයෙනි, මා සමඟ අපේ උරුමය බෙදා ගන්නට මාගේ සහෝදරයාට කිව මැනවැ"යි උන්වහන්සේට කීය. එහෙත් උන්වහන්සේ කතා කරමින් "මිත්‍රය ඔබ කෙරෙහි තඩුකාරයෙකු නොහොත් දේපල බෙදන්නෙකු කොට මා පත් කළේ කවරෙක් දැ"යි ඔහුගෙන් ඇසූ සේක. "තවද, සියලු ආකාර තණ්හාවලින් පරෙස්සම් වන්නට බලාගන්න. මනුෂ්‍යයෙකුට කෙතරම් දේපල තිබුණත් ඔහුගේ ජීවිතය ඒ පිට රඳා නැතැ"යි ඔවුන්ට වදාළ සේක. උන්වහන්සේ උපමාවක් කියමින් මෙසේ වදාළ සේක. "එක් ධනවතකුගේ වතු පිටිවල බොහෝ පලදාව ඇති විය. එවිට ඔහු තම සිතින් කල්පනා කරමින්, මම කුමක් කරම් ද? මාගේ බවභෝග රැස්කර තබන්නට ඉඩ කඩ නැත. මම මෙසේ කරමි. මාගේ අටු කොටු කඩා දමා වඩා විශාල ඒවා ගොඩනගා, ඒවායේ මාගේ සියලු ධන ධාන්‍ය රැස් කොට තබා "මාගේ පිනක මහත අවුරුදු ගණනතකට සෑහෙන තරම් අගනා වස්තු සම්භාරයක් මෙහි රැස් කොට තිබේ. විවේක සුවයෙන් කා බී ප්‍රීති වන්නැ" යි මට ම කියා ගනිමි. එහෙත් දෙවියන් වහන්සේ ඔහුට කතා කොට "අඥානය, අද රාත්‍රියේ දී ඔබගේ ප්‍රාණය ඔබෙන් ගනු ලැබේ. එවිට ඔබ රැස් කොටගත් දෙය කවරෙකුට අයත් වන්නේ දැ"යි වදාළ සේක. දෙවියන් වහන්සේ ඉදිරියෙහි පොහොසත් නොවී තමාට ම වස්තු රැස් කරගන්නා අය එවැනි ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.